**01.**

A පුද්ගලයා ලෙස මම මාව හැදින්වීමට කැමැත්තෙමි. A කුඩා කළ සිට බස් එකේ යාමට කැමැත්තක් දැක්වීය. එම නිසාම A 2 වසර අවසන් කිරීම මත්තෙන් A ගේ අක්කා සමග බස් රථයේ පාසල් යාමට ඒමට පුරුදු විය. එම අවස්ථාවේදී A බස් රථයේ ගමන් යාමට පුරුදු වුවද තවමත් ඇය අවුරුදු 07 දැරියක් විය. A ට බස් රථයේ ගමන් යාම විනෝදජනක වුවද A ට මුහුණ දීමට සිදුවූ යම් සිදුවීමක් සමග එම විනෝදජනක බව තව දුරටත් නොතිබුණි. A බස් රථයේ යන විට ඇයට අසුවූයේ වයසැති පුද්ගලයෙකුගේ ග්‍රහණයටයි. එම පුද්ගලයා A ගේ ශරීරය ස්පර්ශ කළ ද, A ට එහි අකටයුතු බවක් නොතේරුණ ද, කලක් යාමට මත්තෙන් එහි නුපුරුදු බවක් දැණුනු නිසා A එම සිදුවීම පිළිබද සිය දෙමව්පියන්ට දැනුම් දුණි.

එම අවස්ථාවේදී A ගේ මව හා පියා ගොස් මේ පිළිබදව බස් රථ රියදුරන්ට මෙන් ම කොන්දොස්තරවරුන්ට ද දැණුම් දුන්හ. කල්යත්ම A ට එයම පුද්ගලයාගෙන් නොව තවත් මෙවෙනිම පුද්ගලයන්ගෙන් බස් රථ තුළදි දැක ගැනීමට හැකි විය. නමුදු දැන් A කෙමෙන් කෙමෙන් වර්ධනය වන බැවින් කරදරයක් වීමට පෙර එම පුද්ගලයින් පිළිබද නිරීක්ෂණය කර අදුරා ගැනීමට යම් හැකියාවක් ලැබුණි. A එවෙනි පුද්ගලයින්ව මග හැර යාමට උත්සාහ කළේය. එසේ ම මෙවෙනි පුද්ගලයින්ව නැවත රිදවීමට බැන වැදීමට ද A ට සිදු විය.

එසේ වන්නේ ඇයි A ට ප්‍රශ්ණයක් විය. බස් රථයකදී,සමාජ ස්ථාන වලදී කාන්තාවන් විදින පීඩනයෙන් පිරිමින් බලාපොරොත්තු වන්නේ කුමක්ද? නැතිනම් එය පරපීඩක කාමුකත්වය ද, A ට සිතුණි. කෙමෙන් කෙමෙන් වර්ධනය වන තමන්ම මෙවෙනි ශාරීරික වශයෙන් නොහොබිනා වැඩ කරන කල්හි එයට විරුද්ධව කටයුතු කිරීමට පෙළඹුණි.

නමුත් සමහර අවස්ථා වලදී මම දැසින් නුදුටුවද කාන්තාවන්ට මෙන්ම පිරිමි පුද්ගලයන්ට ද මෙවෙනිම පීඩනයන්ට මුහුණ දීමට සිදු නොවන්නේද? එය මා අසා බලා තිබුණ ද සිසැසින් නුදුටු අවස්ථාවකි.

වැඩිවියට එළඹ සිටින මා දැන් යම් ආකාරයකින් පීඩනයන්ට මුහුණ දීමට සිදු වූ විට එය ප්‍රසිද්ධියේ තම පුද්ගලයාව අපහසුතාවයකට පත් නොකරන්නේ නැවත එම පුද්ගලයාගෙන් මා හට ප්‍රතිප්‍රහාර කරයි යැයි බියකිනි. දැන් මා සිදු කරන්නේ එලෙස සිදු කරන පුද්ලයින්ව හැකිතාක් එවෙනි වැඩක් කිරීමට උත්සහ කරන විට දී ඔහුට එය කිරීමට ඇති ඉඩකඩ අහුරා තවත් පුද්ගලයෙක් අපහසුතාවයට ලක් වන ප්‍රමාණය නැති කිරීමයි.

කාන්තාවක් වශයෙන් නිදහස් ස්වාධීනව පොදු ප්‍රවාහන සේවයේ ගමන් කිරීමට මෙන් ම, පොදු සමාජ ස්ථාන වලදී නිදහස්ව ගත කිරීමට කාන්තාවන්ට මෙන් ම, පිරිමියෙකුට අවස්ථාව දීමට කාන්තා හා පිරිමි දෙපාර්ශවයම වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කළ යුතු බව A හි මතයයි.

**02.**

මෙම ලිපිය ලියන මා අනුවර්ත නාමයෙන් නාමලී යනුවෙන් හදුන්වමු. මා කුඩා කළ සිටම දෙමාපියන් සෙවනේ හැදී වැඩී ගත කළ දරුවෙකි. මාගේ මව හෘදයා බාධයකින් පෙළෙන පුද්ගලයෙකි. පියා ගොවිතැන් කටයුතු සිදු කරනු ලබන පුද්ගලයෙකි. ඔහුද මව මෙන් හෘදයා බාධයකින් පෙළෙන පුද්ගලයෙකි.

මා දෙමව්පියන් සෙවනේ ආදරය, ආරක්ෂාව, රැකවරණය, ලැබූ දරුවෙකි. මා උසස් පෙළ කලා අංශයෙන් අධ්‍යාපන හදාරණ අවධියේදී මව මිය ගියේය. එයට හේතුව හෘදයා බාධයක් විය. නමුදු මව මිය ගියේ හෘදයා බාධයකින් නොව මා පිළිබදව සිතූ නිසා යැයි නෑදෑ පිරිස දොස් නගන්නට විය. එහෙත් එසේ කිසිවක් නොවුනි. මා හට එය අදටත් කණස්සලු සහගත

දෙයකි. මාගේ මව මා අතරින් සමුගැනීමට හේතුව මා ද යන්න බව අදටත් මා නොදන්නා කාරණාවකි.

යම් අවස්ථාවලදී මා තනියම ඇඩූ වාර අනන්තය. යම් විටෙක මා හට කාටවත් සොයා ගැනීමට පවා නොහැකි ස්ථානයකට යා හැකි නම් හොඳ යැයි සිතූ වාර අනන්තය. මා මව මිය ගිය පසු නැදෑ ගෙදරක නතර විය. එහිදී එන තාඩන, පීඩනය ද ඉවසා ගත නොහැකිය. ඔවුන් විසින් සෑම විටම මා දෝශාරෝපණයට පවා ලක් කළ අවස්ථා ඉමහත්ය. මා එම කාලයේදී උසස්පෙළ හදාරණ ශිෂ්‍යයෙක්මි. උසස් පෙළ කඩඉමේ අවසන් විභාගය ලං වන විටම මාගේ පියා ද හෘදයා බාධයක් නිසා අසනීප වුනි. එහිදී පියා අසනීප වීමත් මාගේ සිතට ලොකු බරක් විය. මක්නිසාදයත් මා හට මාගේ ජීවිතයේ මව හැර වටිනාම දේ පියා නිසාය. එම ප්‍රශ්ණයත් සමග මා පාඩම් කර විභාගය සඳහා සූදානම් විය. එමෙන්ම එම විභාගයෙන් B B C ප්‍රතිඵල ලබා ගත්තෙමි. නමුදු විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වීමට නොහැකි විය.

නමුදු ඒ ආ ප්‍රශ්ණ ගැටලු පිළිබඳව නොතකා මා දෙවෙනි වරටත් උසස් පෙළ විභාගය සඳහා සූදානම් වුණි. කුමන ප්‍රශ්ණ ගැටලු කම්කටොලු පැන නැගුණත් මා ඉලක්කය කරා ගමන් කරනවා යැයි හොඳින් සිතා හොඳින් පාඩම් කරනු ලැබුවාය.

යම් අවස්ථාවල දී මා හට පාසලෙන් පවා තාඩන පීඩනයන් එල්ල වූ අවස්ථා අති මහත්ය. මන්ද යත් අනෙක් පුද්ගලයන්ට අවශ්‍යය වූයේ මා පහළට ඇද දැමීමය. මාගේ හොඳම යාලුවා පවා පාසල් ජීවිතයේ ප්‍රශ්ණ ඇති කර ලැබූ අවස්ථා ඉමහත්ය. මා අසා ඇති ආකාරයට වැටුනොත් ඒ වැටුනට වඩා එක තප්පරයක් හෝ ඊට වැඩියෙන් නැගිටින්න අප උත්සහ කළ යුතුය යන්නය.

එම වදන මාගේ හදවතේ හිතේ තබා ගෙන මොන බාධකයක් ආවත් මාගේ ගමන මා යන බව හිතා ගතිමි. එහිදී මා උසස් පෙළ කලා අංශයෙන් විභාගය කර A A B ලබා විශ්ව විද්‍යාල වරම් ලබා ගැනීමට සමත් විය.

අද මාගේ ජීවිතය දෙස හැරී බලද්දී මා මා ගැනම ආඩම්බර වීමට හේතු ඕනෑ තරම්ය. ගැහැණු ළමයෙකුගේ වැදගත්ම ආභරණය ලෙසට මා දකිනු ලබන්නේ අන් කවරක් නොව, අධ්‍යාපනය හෙවත් උගත්කමයි. කුමන ගැටලු, ප්‍රශ්ණ පැමිණියත් මා මෙන් අනෙක් අයත් ප්‍රශ්ණවලට බිය නොවී හොඳින් මුහුණ දී තම ජීවිතය සාර්ථක කර ගන්න ලැබේවා යැයි මා ප්‍රාර්ථනා කරමි.

**03**

මම මුලින්ම ගැහැණු පාර්ෂවයට කෙතරම් සීමාවන් තියෙනවද යන්න තේරුම් ගත් ජීවිත අත්දැකීම ලෙස මේ සිද්ධිය ගන්න පුලුවන්. මම මුලින්ම ආදර සබදතාවයක් පටන් ගන්න විට මාගේ වයස අවුරුදු 16 මම එතකොට සාමාන්‍ය පෙළ කරනවා. මගේ අම්මයි තාත්තයි ගොඩක් Open minded එයාලා මට හැම තිස්සෙම කිව්වේ affair එකක් තිබ්බට කමක් නෑ Bc2 it's not Something magical, නමුත් මගේ Education වැඩ වලට ඒක effect එකක් වෙන්න බෑ කියලා. ඒ නිසාම මම ගෙදරට කියල තමයි affair එක පටන් ගත්තේ. අනිත් එක එයාලා මාව Trust කළා. අපේ සම්බන්ධෙට එයාගේ ගෙදරින් මුලින් අකමැති වුනා. හේතුවක් නැතිව පස්සේ කැමැති වුණා. කොහොමහරි o/l කළාට පස්සේ ගෙවල් දෙකේම කැමැත්ත තිබුණත් මම එයත් එක්ක තනියම යන්න කැමැති වුණේ නෑ. මොකද මම එතකොට 9As අරගෙන අලුත් පාසලකට ගිහින් තිබුන නිසා මට බය හිතුනා මම ඇවිදිනවා ගුරුවරයෙක් දකීවී කියලා. කොහොම නමුත් මාගේ අම්මයි තාත්තයි මට කවදාවත් නීති දාපු අය නෙවේ. එයාලට කියන්න දෙයක් තියෙනවනම් එයාලා මට ඒක මූණට කියනවා. මාත් එහෙමයි එයාලට අදටත් කවදාවත් කිසිදෙයක් හංගලා නෑ.

නමුත් මට ටික ටික තේරුණ දෙයක් තමයි මගේ අම්මට තාත්තටත් වඩා එයාගෙ අම්මයි තාත්තයි මට නීති දානව කියන එක. මං ඒක අම්මට කිව්වම එයාලා කිව්වේ ගණන් ගන්න එපා කියලා. කියන විදිහට පොඩ්ඩක් ඉන්න කියලා. එයාගේ අම්මටයි තාත්තටයි හැම තිස්සෙම ඕනි උනේ  මම එයාලගේ පුතාට වඩා පහළින් එයාට බයෙන් ඉන්න. මම ගැහැණු ළමයා නිසා එයාලා මට එහෙම කරන්න කිව්වේ. But why a girl should be under control of a boy? That was the problem I always encouraged him to make me under control. මේක එයාලගේ පවුල ඇතුලේ එයාලා හදාගෙන තිබ්බ Culture එකක්. එයාගෙ අයියගෙ ගැහැණු ළමයා මගේ වයසම. ඒ ගෑණු ළමයා එයාගේ අප්පච්චී බය කරගෙන හිටිය ද කිවුවොත්, එයාගෙ අයියටයි අප්පච්චිටයි Even for maiex ටත් පුදුම බයක් තිබ්බේ. රවලා බැලුවත් අඩනවා. So they expected it from me also Why because I was going to be their ලේලි But මගේ family එක හැමතිස්සෙම මගේ පැත්තේ හිටිය නිසා I had strong Personality. මම එයාලට බය කෙනෙක් වුණේ නෑ. අනෙක එයාලා මට අදින්න එපා කියලා ඇඳුම් ගොඩකට නීති දැම්මා. But I dress for my self not for them. ඒ නිසා they were not able to make me under control. ඊට පස්සේ එයාලා මට කිව්වේ To make this relationship stronge I have go out with him alone But I disagree Bc2 I didn’t want to creat a bad image and also my family specialy thaththa was against it Then they try to put me in to a cage saying that university යන්න කලින් I shouldbe engaged නමුත් I didn’t want it Bc2 I wanted to go to the university as a Student not as a married Woman. එයාලා මේ හැම දෙයකින් ම මාව කොටු කරන්න හදපු ප්‍රධානතම හේතුව දැන් මේ සම්බන්දය ගෙවල් වල අය හැමෝම වගේ දන්නවා මෙයා ගෑණු ළමයෙක් නිසා දැන් මේක නවත්තලා මෙයාට පාරෙ බැහැලා යන්න බෑ කියලා හිතපු නිසා. ඒ අතරෙම They wanted their son to enjoy his life in a private university keeping me as the spair wheel But for god sake my family was there for me nad they helped me to come to a conclution. අන්තිමේදී මම තීරණට කළා  “To stop that “ කවුරු කොහොම කිවුවත් මම කවදාවත් වැරැද්දක් කරලා නෑ කියලා මම දන්න නිසා මගේ දෙමව්පියෝ දන්න නිසා as a Strong Women I was able to take the wise life changing decision.

**4.**

ලිංගිකව පමණක් හිංසනය කාන්තාවකට මානසිකවද සිදුවෙන්න පුලුවන්. මගේ නම අනුවර්තන හඳුන් වනුයේ පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගනු පිණිස ය. මා විශාකා ලෙස හඳුන්වමි. මා කුඩා කාලයේ එනම් මට අවුරුදු හයක් පමණ වයසැති දී සිදු වූ පීඩාකාරී සිදුවීමකි.

මා ව්‍යාපාරික පවුලක සිටින එක්ම දියණිය දිය. සෑම දෙනාගේම සුරතලී වූවාය. මාගේ පියාගේ වෙළඳසැලේ කටයුතුවලට උපකාර කළෙමි. එහෙත් එක් දවසක කඩයට පැමිණි ගමේ අවුරුදු හතළිහක පමණ මැදිවවයසෙ පුද්ගලයෙකු දෙමාපියන් නැති අතරේ මා හට කරදර කිරීම්ට උත් උත්සහ කළේය. මා හට එම සිදුවීම් වුනොත් ඒ නොතේරුණද ඔහුට විරුද්ධ වී ඉවතට දිව ගොස් සැඟවී ය.

පසුව තාත්තා පැමිණි විට මා මෙය ඔහුට කීමට උත්සාහ කළ ද මගේ වුනොත් ඒ නොතේරුම්ක මට මෙය පැහැ පැහැදිලි කිරීම්ට නොහැකි විය. පසුවද එම පෙර සඳහන් කළ මිනිසා මා හට ළංවීමට උත්සාහ කළ අතර එය ඉවසාගත නොහැකි තැන මා මවට පැවැසිණි. පසුව ඔවුන් පොලීසියට පැමිණිලි කිරීම්ට උත්සාහ කළ ද එම පොලීසියේ සිටි කාන්තා පොලිස් නිල නිලධාරිනිය තැකීමකට නොගත්තේ ඇයි දැයි, ගැහැනු දරුවන් නැති නිසා දැයි… මට එය තේරුම් ගියේ මට තේරෙන කාලයේදීය.

පොලිසියෙන් පිළිසරණක් නොලද මගේ දෙමාපියන් මිනිසුන් ලවා ඔහුට පීඩා ගෙන දුන්න ද ඔහු තවමත් නිදැල්ලේ අහිංසක පවුල්වලට දුක් දෙමින් සිටී. කාන්තාවකට පමණක් නොව කුඩා දරුවන්ට පවා හිංසනය සිදු වන මෙම සමාජයේ පොලිසිය නම් නීතිය රකින ආයතන මෙලෙස ක්‍රියා කිරීම කෙතරම් අප්‍රිය දැයි අවුරුදු විසිතුනක් පසු ඔහු දැකීමෙන් මා හට සිහි වන්නේය.

දිට්ඨ ධම්මවේදනීය කර්මය එළදී ඔහු අද දරුණු රෝගයකට ගොදුරුව පීඩා විඳිනු ලබයි. දැන් ඔහුගේ තත්ත්වය දුටු විට මා හට වෛරයක් නැත්තේ ඔහුට අනුකම්පාව දක්වනු ලබන නිසා වෙනි. මෙහි නම් ගම් මනකල්පිත වන අතර එහෙත් මෙය සත්‍ය සිදුවීම්කි.

**5.**

මම ඉස්සෙල්ලම බස් එකේ යන්න ගත්තේ 2013දී, මම 07 ශ්‍රේණිය වෙද්දි. එතකම් මාව ක්ලාස් ගෙනිහින් දැම්මේ ගෙදරින්. ගෙදරින් මම බස් එකේ යන්න කිව්වොත්, මගේ යාලුවයි අම්මයි එක්ක, maths class තමයි මම ඉස්කෝලෙ ඒ විදියටම ගියේ. මගේ යාළුවා කලින් ඉඳන්ම බස් එකේ ගිහින් තියෙන නිසා මට එහෙම බයක් තිබුණෙත් නෑ. ඉතින් මම එයාගේ අම්මයි එයයි එක්ක ක්ලාස් එකට යනවා. 9 වසරේදී වගේ මගේ යාළුවා maths class එක නැවැත්තුවා.

එතකොට මට බස් එකේ යන්න හුරු වෙලා තිබුනේ. අම්මත් කිව්වා තනියම යන්න පුළුවන්නේ. මම කැමැත්තෙන් ගියා. මොකද අඳුරන අය බස් එකේ යන නිසා දවසක් ක්ලාස් එක ඉවර වෙලා ගෙදර එද්දි බස් එකේ මනුස්සයෙක් මගේ ඇඟට හේත්තු වෙලා එයාගෙ private area ගාවනවා. මම එදා තමයි ගොඩක්ම බය උන දවස thanks god ටික වෙලාවකින් එතන හිටපු ඇන්ටි කෙනෙකුයි අන්කල් කෙනෙකුයි ඒක දැක්කා. ඒ හින්දා මගේ බය අඩු වුනා. ඒ ආච්චි හයියෙන් කෑ ගහලා කිව්වා මේ මනුෂ්‍යයා බස් එකෙන් එළියට දාන්න කියලා. එතකොට මිනිස්සු හැමෝම ඒ මිනිහට ගහලා එළියට දැම්මා. මම බය වෙලා ගෙදර ඇවිත් ඒක

අම්මලාට කිව්වා. අම්මලා ගොඩක් බය උනා. ඊට පස්සේ මාත් එක්ක ආච්චි ක්ලාස් එකට යන්න ආවා.

අම්මලා work කරනකොට බිසී නිසා මම ආච්චි එක්ක ක්ලාස් ගියා. ආච්චිත් අසනීප වුණ නිසා මම තනියම යන්න ගත්තා නැවතත් කලින් උන විදිහටම මනුස්සයෙක් ආවා. මම එතනදී බය වුණෙත් නැහැ. මම හයියෙන් කෑ ගැහුවා. එතකොට බස් එකෙන් බැහැලා ගියා.

ඒ වගේ දේකදී බයවෙලා කටවහන් හිටියොත් ඒ ඒ මිනිස්සුන්ගේ අරමුණු සාර්ථක කර ගන්න ලේසියි. ඒ නිසා එකට විරුද්ධව එක තියාගෙන ඉන්නේ නැතුව තමන්ගේ ආරක්ෂාව තමන් ගන්න ඕනේ කියන දේ කියාගෙන මම අදත් බය නැතුව පාරෙ යනවා. ඒ වගේ දෙයක් වෙනවා දකිද්දී මම ඒ ලමයව බේර ගන්න ක්‍රියා කරන්නේ එතකොට එන අපහසුතාවක් මම දන්න නිසා, ගැහැණු ළමයෙක් තමන් කැමති ඇඳුමක් style කරද්දි ඒකට පිස්සු හැදිලා ඒකට පිස්සු හැදිලා තමන්ගේ ලිංගික ආශාවන් පිට කරන්න බලන් ඉන්න මිනිස්සු ඉන්න රටක් මේක.

ඒ හේතු නිසා මම කියන්නේ කැමැතියි sex education පාසල් විෂය පද්ධතියටට ඇතුලත් කරලා,ඒ පිළිබඳව හොඳ අවබෝධයක් දරුවන්ට ලබා දිය යුතුයි. ඛේදනීය තත්ත්වය ලංකාවේ school වල මේ ගැන උගන්වන්න ටීචර්ලත් ලැජ්ජයි. education කියලා ප්‍රජනක පද්ධතියේ රූප දෙකක් දාලා වැඩක් නැහැ. ඒ ගැන උගන්නන්න හරි පුහුණුවීමක් teachers ලටත් දෙන්න ඕනේ.